# රස ගුණ වඩන කෙසෙල්

පලතුරු ශරීරයට අවශ්‍ය පෝෂණ පදාර්ථ ලබා දෙනඅතුරුපසක් ලෙස ජනප්‍රිය ආහාරයක් වුවද වතුපිටිවල පහසුවෙන් වැවෙන නිසාදෝ පලතුරු වලට මෙරටේ නිසි සැලකිල්ල නොලැබේ. ඒ නිසා ශ්‍රී ලංකාවේ පලතුරු වල ඒකපුද්ගල පරිභෝජනය ඉතාම පහත මට්ටමක පවතී. ජන ලේඛණ දෙපාර්තමේන්තුව මගින් 1980/81 පවත්වනු ලැබූ සමාජ ආර්ථික සමීක්ෂණය අනුව ඒක පුද්ගල පලතුරු පරිභෝජනය මසකට කෙසෙල් ගෙඩි 3.2 ක්, පැපොල් ගෙඩි 0.4 ක්, අන්නාසි ගෙඩි 0.1 ක්, අඹගෙඩි 0.5 ක් සහ දෙඩම් ගෙඩි 0.1 ක් වේ.

වැඩිපුර පලතුරු පරිභෝජනය කිරීමට ශරීර ශක්තියට සෞඛ්‍යයට අත්‍යාවශ්‍ය බවට වෛද්‍යවරුන් නිර්දේශ කලත්, වෙළඳපලෙන් පලතුරු මිලදී ගැනීම සිදුවන්නේ අඩුවෙනි. මෙයට හේතු කීපයක් ඇති අතර මිල අධිකවීම එකක් වේ. වෙළඳපලෙ කෝලිකුට්ටු වර්ගයේ කෙසෙල් ගෙඩියක් සාමාන්‍යයෙන් රුපියල් 1.50 ක මුදලකටත්, අන්නාසි ගෙඩියක් රු. 10 කටත්, පැපොල් ගෙඩියක් රුපියල් 8 කටත්, කර්තකොළොම්බන් වර්ගයේ අඹ ගෙඩියක් රුපියල් 6 කටත් මිල තක්සේරු වී ඇත. මේ නිසා අඩු ආදායම් මට්ටම්වල සිටින අප බොහෝ දෙනෙකු අපේ ආහාරයට අත්‍යාවශ්‍ය බව නොපෙනෙන පලතුරු සඳහා එතරම් මුදලක් වැය කිරීමට මැලි වෙති.



භාණ්ඩ ප්‍රවාහනයට කරත්තද යොදගැනේ

බොහෝ පලතුරු විශේෂයන් කෙසෙල්, පැපොල්, බෙලි වැනි වර්ග වල ඇති ආහාර ජීරණය කිරීමේ ශක්තියත්, ඒවායේ ඇති ඖෂධීය ගුණයත් නිසා වෛද්‍ය වරු පලතුරු වැඩිපුර පරිභෝජනය කිරීමට නිර්දේශ කරති. අපේ රටේ ජනප්‍රිය පලතුරක්වන කෙසෙල් මීට අවුරුදු 5000 ට පමණ සිට මිනිසා විසින් හඳුනා ගත් ආහාරයකි. ප්‍රධාන වශයෙන් අප්‍රිකාව, මධ්‍යම ඇමරිකාව, ඉන්දියාව, මලයාව, දකුණු චීනය, මුරිසි දූපත් යන සමී කලාපීය රටවලට නෑකම් කියන කෙසෙල්, දකුණු ඉන්දියාව, මලයාව, චීනය, මුරිසි දිවයින වැනි රටවලින් ශ්‍රී ලංකාවට පැමිණ ඇතැයි විශ්වාස කෙරේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් දනට හෙක්ටයාර් 30,000 ක පමණ කෙසෙල් වගාකර ඇත. වෙනත් වචන යකින් කිවහොත් කෙසෙල් ශ්‍රී ලංකාව පුරාම වගා කරන පලතුරු වර්ගයක් වන අතර කෙසෙල් ගස් කීපයක් නැති ගෙවත්තක් ශ්‍රී ලංකාවේ නොමැති තරම්ය. දනට ශ්‍රී ලංකාවේ කෙසෙල් වර්ග 27 ක් පමණ හඳුනාගෙන තිබේ. ඒවා නම් සුදු මූව ඇති කෙසෙල්, අළු කෙසෙල්, ඇටඹුරු, සළුවෙල්, හම්බන් පුවාළු, මෝන්දම්, වදන කෙසෙල්, වල් සුවඳැල්, වතුපාළු, පුවාළු, බිම් කෙසෙල්, රට කෙසෙල්, රත් කෙසෙල්, සුවඳැල්, හොඬරවාළු, රනිල්, කිතල, කෝලිකුට්ටු, සීනි කෙසෙල්, රතඹලා, වර්දමාන, ගල් ආනමාළු, නවාරි මීගමු ආනමාළු, පිසාද් ඇඹුන් (ඇම්බුන්) සපුමල් ආනමාළු ආනමාළු, කොට්ට් කෙසෙල්, රත්දෙබේ ඉන් සමහරකි. මේවා අතුරින් ශ්‍රී ලංකාවේ වැඩි පුරම වගා කරන වර්ග ඇති අතර ඒවාට විශේෂිත වූ ප්‍රදේශද ඇත. කෙසෙල් ප්‍රධාන වශයෙන් කුරුණෑගල, මහනුවර, කෑගල්ල, රත්නපුර, සහ මොණරාගල දිස්ත්‍රික්ක වල වගා කෙරේ. මහනුවර කෑගල්ල, යන දිස්ත්‍රික්ක ආනමාළු, ඇම්බුන් වැනි ලොකු වර්ගයේ කෙසෙල් වලටත්, රත්නපුරය, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් කෝලිකුට්ටු, ඇඹුල්, යන වර්ග වලටත්, ප්‍රසිද්ධය. ඇඹුල් කෙසෙල් සෑම දිස්ත්‍රික්කයක්ම පාහේ වගා කෙරේ.

ලංකාව කෙසෙල් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක යක් වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල, ඇඹිලිපිටිය, පල්මලබැද්ද යන ප්‍රධාන වගා ප්‍රදේශ කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල් වලට ප්‍රසිද්ධය.

මෑතකදී එම ප්‍රදේශවල කල සමීක්ෂණයක් මගින් කෙසෙල් අලෙවියට සම්බන්ධ දුෂ්කරතා කීපයක් එළිදරව් වී ඇත. කෙසෙල් ප්‍රවාහනය ප්‍රධානතම දුෂ්කරතාවයයි. මෙය බොහෝ දුරට බලපාන්නේ දුෂ්කර ප්‍රදේශවල එනම් මාර්ග පහසු කම් නැති ප්‍රදේශ වලට සහ ප්‍රධාන පාරෙන් ඈත පිහිටි ප්‍රදේශ වලටයි. කෙසෙල් අලෙවියේදී ගොවීන් අතර, වඩාත් ජනප්‍රිය 'ගම්බද පොලවල්ය.' මේ වර්ගයේ පොලවල් සතියේ සෑම දවසකම පාහේ තිබෙන අතර කෙසෙල් වලට පමණක් සීමා වූ වෙළඳපලවල් ද ඇත. ගොවියා විසින්ම හෝ ගම් මට්ටමේ කෙසෙල් එකතු කරන්නන් විසින් හෝ කෙසෙල් වෙළඳපලට ගෙන එනු ලබයි. ඊට අමතරව

(1) ගම් මට්ටම් එකතු කරන්නන්

(2) නාගරික මට්ටම් එකතු කරන්නන්

(3) පිට වෙළෙන්දන් (දුර නගර වලින් ලොරි රුගෙන පොලට එන වෙළෙන්දෝ)

(4) කොමිස් වෙළෙන්දන් (තොග වෙළෙන්දෝ)

(5) සිල්ලර වෙලලන්දෝ

යන වෙළඳ නියෝජිතයන්ද ගොවීන්ගෙන් කෙසෙල් මිලදී ගනිති.

රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් අලෙවියේදී ගොවීන් අතර ජනප්‍රිය අලෙවි මාර්ග දෙකක් සඳහන් කල හැක. ඒවා නම්,

1. ගොවියා - ගම්මට්ටමේ එකතුකරන්නන් — කොමිස් වෙළෙන්ද (තොග වෙළෙන්ද)

2. ගොවියා - එකතුකරන්නන් — දුර නගර වලින්, ලොරියක් සමඟ පැමිණෙන වෙළෙන්දා

ගම් මට්ටමේ එකතු කරන්නන් ගමේම ජීවත්වන පුද්ගලයන් අතුරෙන් කෙනෙකු වන අතර ගොවිපලට ගොස් ගොවීන්ගෙන් කෙලින්ම මිලදී ගැනීම කරයි. ඔහු ගමේම ජීවත් වන පුද්ගලයෙක් බැවින් කෙසෙල් වතු ඇති ප්‍රදේශ එක් එක් ගොවිපල වල කෙසෙල් කැන් වැවෙන කාලය පිළිබඳ හොඳ දැනීමක් ඇත. ගොවීන්ගේ ඕනෑඑපාකම් වලදී ණය පහසුකම් ලබාදීම, පුද්ගලික දන හැඳුනුම්කම් වැනි හේතු නිසා ගම්මට්ටමේ එකතු කරන්නා, ප්‍රදේශයේ ගොවීන්ගේ මිතුරෙකි. ගොවීන්, මොහු අයතු ලාභ නොගන්නා බවට සැලකෙන **විශ්වාසයකින්** කටයුතු කරයි. නගරයෙන් ඈත පිටිසර ප්‍රදේශ වල අලෙවිකරණය සම්බන්ධ වෙනත් කිසිදු ආයතනයක් නොමැතිකම නිසා මෙම ගම්මට්ටමේ එකතු කරන්නන් කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපිත වී ඇත. සමහර විට ඔහු ගොවියා හා වෙළෙන්ද අතර මැදි එකම පුද්ගලයා බවට පත්ව ඇත. මේ මට්ටමේ එකතු කරන කෙසෙල්කැන් පිට පලාත් වලින් එන ලොරි වලට හෝ නගර මට්ටමේ එකතු කරන්නන්ට අලෙවි කරයි.

සාමාන්‍යයෙන් කෝලිකුට්ටු, ආනමාළු සහ ඇඹුන් යන මිල වැඩි කෙසෙල් වර්ග ගෙඩි ගණන් අනුවත්, ඇඹුල්, සීනිකෙසෙල් වැනි කෙසෙල් වර්ග කැන් අනුවත් මිල කිරීම කරනු ලබයි. 1985 ජනවාරි මාසයේ රත්නපුර දිස්ත්‍රික්කයේ කල අධ්‍යනයකට අනුව සාමාන්‍ය ප්‍රමාණයේ කෙසෙල් කැනක් සඳහා ගොවියා ලබන ආදයම පහත සඳහන් අයුරු වේ.

ඇඹුල් - ගෙඩි 150 ක තැනකට රු. 27.50 (ගෙඩියක් ශත 18)

ආනමාළු - ගෙඩි 150 ක කැනකට රු. 57.50 (ගෙඩියක් ශත 38)

කෝලිකුට්ටු - ගෙඩි 100 ක කැනකට රු. 48.00 (ගෙඩියක් ශත: 48 යි)

සාමාන්‍යයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වෙළඳ පල වලට ගාල්ල, මාතර, දෙනියාය, යන අවට ප්‍රදේශ වල නගර වලින් සැරෙන්නට. පානදුර, මොරටුව, රත්මලාන, හෝමගම, මහරගම, නොටලග ගම්පහ, හැටන් යන ප්‍රදේශ වලින් ද, ලොරි සමග වෙළෙන්දන් පැමිණෙති. මෙම වෙළෙන්දන් ගෙන් වැඩි මිලක් ලැබෙන බවට ඇති ආකල්පයක් නිසා මාර්ගාසන්න හා නගරාසන්න ගොවීන්ගෙන් වැඩි දෙනෙක් තම කෙසෙල් මෙම වෙළඳුන්ට අලෙවි කරති. කෙසේ වෙතත් ඉහත සඳහන් කළ අලෙවි ක්‍රම දෙක යටතේ එකතු කරන්නා ලබන කොටස් සිල්ලර මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් පහත සඳහන් අයුරු දක්විය හැක.

| වෙළඳ ක්‍රමය | එකතු කරන්නාට ලැබෙන කොටය සිල්ලර මිලේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|
| | ඇඹුල් | ආනමාළු | කෝලිකුට්ටු |
| කොමිස් වෙළඳ ක්‍රමය | 16.5% | 14.3% | 13.1% |
| පිට වෙළඳුනට විකිනීමේදී | 25.9% | 18.2% | 17.6% |

එම අලෙවි මාර්ග දෙකේදී අලෙවි ක්‍රියාවලියන් සඳහා යන වියදම් පහත අයුරු දක්විය හැක.

අලෙවි වියදම සිල්ලර මිලෙහි ප්‍රතිශතයක් වශයෙන්:

| | ඇඹුල් | ආනමාළු | කෝලිකුට්ටු |
|---|---|---|---|
| කොමිස් වෙළඳ ක්‍රමය | 63.3 | 55.8 | 56.4 |
| පිට වෙළඳුනට විකිනීම | 54.2 | 47.7 | 43.5 |

මේ අනුව පිට වෙළඳුනට විකිණීමේ ක්‍රමයේදී බඩු සපයන්නාට වැඩි වාසියක් ලැබීමට ඇති ඉඩකඩ වැඩි වීම පැහැදලිය. කෙසේ වෙතත් කෙසෙල් ශ්‍රී ලංකාවේ ඇති ජනප්‍රියතම පළතුරු වර්ගය වන අතර එය අවුරුද්දේ සෑම කාලයකම ලබා ගත හැක. නමුත් ඒ සඳහා තවම ක්‍රමානුකූල අලෙවි රටාවක් හැඩ ගැසී නැති බව පෙනේ. එම නිසා නිෂ්පාදකයින්ට තම නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කර ගැනීමේදී නොයෙකුත් දුෂ්කරතා එනම් හොඳ මිලක් ලබා ගැනීමට නොහැකිවීම, ප්‍රවාහන පහසුකම් නොමැති වීම, මතුවී ඇත. හොඳ අලෙවි රටාවක් ඇති කිරීමට ඒ සඳහා වූ ආයතන වල දැඩි අවධානය යොමු වනවා නම්, කෙසෙල් ගොවීන්ට මහත් රුකුලක් වනු ඇත.

**ආර්. පී. යූ. පතිරණ**
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී,
අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය.